


## නමදිමු ඔබ ගුණ දම්පල් සමිඳේ !

සිරිලක් අඹරට පැයූ පුන්සඳ
ඔබ වූයේ ඒ අඳුරු යුගයේ
පන්නා මිසදිටු
හැතිකර අදැමිටු
ලක සදහම් දීපය කරවූයේ
බුදුන් උපන්දෙස
යළිදු නගා සිටවූයේ
ඔබ වැනි සමතෙකු
බිහිවෙද කිසි දින ?
ඔබ ලක් පොළවේ
යළි ඉපදෙන තුරු
සිරිලක් මාතා බලා සිටින්නී

♦ DAREN - London

## දම්පල්තුමා නොසිටින්ට.....?

විසිවන සියවසේ සිරිලක අඳුරු යුගේ
රට දැය එළිය කළ පුන්සඳ මඩල වගේ
සැබැවින් තියම සිංහලයෙකු නමට අගේ
පූජා කරමි මේ කවිමල් පොකුර මගේ

නැගිටිව් සිංහලුනි නැගිටිව් සිංහලුනී
ආරිය කුල සිරිත් රැකගනු අති රමණී
යනුවෙන් කියූ පුත් රුවනක් නැති බැවිනී
ඔබ අසරණයි අද සිරිලක් මැණී යනී

රටදැය සමය නැගුමට ඇතිකොට රුතිය
දුරු කළ අපේ ජාතික පැකිලෙන ගතිය
එතුමා නොහිටින්ට ළඟ ලක් සිරි මතිය
සිංහල ජාතියක් අද මිහිපිට නැතිය

ගෙරිමස් කකා කලු සුද්දන් වෙන්න එපා
අම්මා තාත්තා මිස නැත මමා පපා
මේ වැනි අවවාද පද ඇත දැනට කපා
ඒවා සාම, එන්ජීඕ කාර උපා

බුධගයා නුවර පෙර ලොව බොදු නුන්ට
තහනම් වී තිබුණි හැර නොබොදුනු වන්ට
දම්පල් වීර උතුමාණන් නොසි ටින්ට
නොලැබේ අපට අද දඹදිව වැඳ ගන්ට

දම්පල්තුමා ගත් හරිමග කරණ කොට
සිංහල ජාතියක් පවතී දෙරණ පිට
දරුවනි වී ලෙස අද යුද බිමට බට
දම්පල්වරු වෙයවි රැකුමට සිහල රට

*අභාවප්‍රාප්ත කවීන්ද්‍ර*
♦ *සිරිසෝම හරිශ්චන්ද්‍ර*

## මා සුදු දෝණියේ....!

දුවේ මා අමතන්නකෝ
ආදරෙන් එක වචනෙකින්
තාත්තේ මගෙ තාත්තේ යයි
කියන් මට ඒ ඇති දුවේ.....

සෙනේහය අද කොහි ගිහිල්ලද?
හොරු අරං පැන ගියා සේ.....
තුරුළුකරගෙන හිටපු කාලේ
රූප වෙයි අපෙ තනි රකින්නේ

රැඳී ඉන්නේ තවම අප ළඟ
ඒ නුඹේ පුසුඹයි දුවේ...!
දුවේ ඒ පුසුඹයි දුවේ
අපේ සිත හද පිරිමදින්නේ

දුන්නු ජීවය අප කැදැල්ලට
දෙනවදෝ යළි පෙර ලෙසේ
ඉඳලා හිටලාවත් බලන්නට
වරෙන් මා සුදු දෝණියේ....

එනතුරුම මග බලා ඉන්නම්!
කැදැල්ලත් අරගෙනම පැටියෝ
ඇවිල්ලා යළි ගිය හැකියි නේ
එනවදෝ සුදු දෝණියේ....

♦ *අමර ගුණසේකර*
France

## සිරිමා බෝ සමිඳු වන්දනා

සිලි සිලි බෝපත් හඬ මට ඇසුනා
තිසරණ ගුණ මට නිතරම ගැයුණා
ඔබෙ පා මුල නවගුණ වැල අමුණා
සිල් ගත් හැටි මට සිහියට නැගුණා

රන්වන් බෝපත් සිලි සිලි නාදෙන්
සෙලවෙනවා මට ඇසුණා හීනෙන්
සිටියත් මා මෙහි දුක සැප මැද්දෙන්
දැනුණා සුවයක් ඔබෙ ගුණ ගැයුමෙන්

පුන් සඳ දුටුවිට මෙහිදී දිස්වන
එහි හැඩ දුටුවෙමි හරියට ලස්සන
කඳු හෙල් මිටියාවත් වැනි දස්සන
නැත මෙහි දුටුවේ සිත තොස වස්සන

බාදා කිසිවක් නොමවුණු හින්දා
දිනකට සැරයක් මම ඔබ වැන්දා
මාගේ දුක් ඔබ නැති කළ හන්දා
මා එව්වට දෙමි පඬුරක් බන්දා

පාට හතක් ගෙන ගොතමින් මල් දම්
දල්වා කපුරුද කස්තුරි හා දුම්
උණුසුම් වතුරෙන් නාගෙන උදයෙම්
කිරි කළ හතකින් නාවමි ඔබ මම්

♦ *රත්නාවලි කුමාරි දිසානායක*
Hounslow Middx UK

## ඒ පුංචි දැරිවිය

දකියි ඇය..
මග තොට යන එන
නෙකවිධ මිනිසුන්

සමහරෙක් ප්‍රීති මුවින් ද
තවත සමහරෙක්,
රවා බුම්මාගෙන ද
එහාට මෙහාට යයි එයි

නොසිතූ මොහොතක
ඇය දෙසට,
දිගු වෙයි අතක්
බිම ඇතිරූ ඉටි රෙද්දට
වැටෙයි කාසියක්

සැණෙකින් බලයි
ඇය තම මව දෙස.
සිය බිළිඳු සොයුරා
උකුලේ හොවා
යනෙනා දනන් වෙත
බැල්ම රඳවා අයැදින

ඇය ද ඇය හා
බලයි ඔවුන් දෙස

මොහොතකින්
නෙතු බිමට හරවා,
වැරහැලි ගවුමේ
සිදුරක් හාරයි.
දූවිලි නාගත්
හුරුබුහුටි පුංචි දෙපා
එකින් එක පිරි මැදෙයි.

♦ *එරංගා පෙරේරා*
Netherlands

## හැරමිටි වාරුව

වියළී ගිය දණ්ඩක් පණ ඇවිදින්
දයාව වගුරන මෙත් කරුණාවෙන්
මගෙ තනියට තනි රකිමින් නිරතුරු
මහළු වියේ මා ගාවම ඉන්නේ......
අබල දුබල මගෙ ගතට වාරු දී
හැකි හැම විටෙකම පිහිටක් වෙන්නයි
ඇවිදගන්න බැරි ගතට දිරිය දී
අබලන් ගේකට මුක්කුගහන මෙන්
දුබල දෙපාවල බර කරගහගෙන
අලුත් පාදයක කාරිය කරමින්
ගතටත් සිතටත් අලුත් පණක් දී
පණ ඇති කකුලක් සේ හැසිරෙන්නේ
වියළී ගිය ලී දණ්ඩක් වෙනමුත්
මගේම සිරුරේ කොටසක් වෙන්නයි
බල්ලන් බුර බුර ළඟට පනින කොට
අහසට පැනලා උන් එළවන්නයි
ඇහැකණ නොපෙනෙන මහ රැයකදි වුව
අන්ධ යෂ්ටියක කාරිය කරමින්
යන එන මං හරි හැටි පෙන්වන්නයි
කලුවර වැටුණම ගොදුරු සොයාගෙන
මහ මඟ හැසිරෙන සතා සර්පයින්
තාලෙට හඬදෙන ටොක්ටොක් සද්දෙන්
බියකර මහපාරෙන් එළවන්නයි
දියපාරක් හරහා යන කොට වුව
අනතුරුදායක තැන් පෙන්නා දී
වියහැකි වියසන වලකා ලන්නයි
කළ උපකාරෙට කිසිවක් නොපතා
හුදු මෙත් කරුණා මුදිතා ගුණයෙන්
උපෙක්ෂාව පෙරදැරි කර නිතරම
සතර බ්‍රහ්ම විහරණයේ හැම ගුණ
වියලුණු ලීයට කොහොමද එන්නේ
මහ බඹු මැව් ලොවකලු අප ඉන්නේ



ඒක වෙන්න ඇති
බඹ අනුහසයෙන්
සතර බ්‍රහ්ම විහරණයම කැටිවී
ආදර්ශයකින් ජීවමාන වී
ලී දණ්ඩකිනුත්
අපට පෙනෙන්නේ !

♦ *මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*
Harrow UK

# නිර්මාණ Nirmana

## අහිමි පෙමට උපන් කඳුළු

කන්ද කපා පායපු සඳ කඳු අතරේ සැඟ වුණාය
නියර දිගේ පවන් සලන වෙල් දිනිතිය මැල වුණාය
මලිත් බටිති සිහින් හඬින් ගැයූ ගීත නිම වුණාය
ගමේ මැණික ගමට හොරා පිට ගමකට හිමි වුණාය

සිහින් හඬින් තෙපුල බසින් මත්වී හද කිති කැවුණා
අහිමි පෙමට උපන් කඳුළු නෙත් අතරින් බිම වැටුණා
සිහින ලෙසින් මැවුණු රූප බොඳ වී ගොස් ඉරි තැළුණා
ලොවම මගෙන් වෙන්ව ගොසින් තනිකම පාළුව දැනුණා

පෝය දාට බෝ මළුවේ එක අසුනක මල් පුදන්න
බණ මඩුවේ කොණක ඉඳන් නාහිමිගේ බණ අහන්න
දේවාලේ කිරි දානෙදි එකතුවෙලා දන් බෙදන්න
මම ආසයි තනිකඩවී ගමට වෙලා යළි සිතන්න

පොත් මිටියක් තුරුළුකරන් පාසැල් ගිය අඩි පාරේ
වැලි කැටවල රැඳුණු ඔබේ ඡායා රුව අත නැරේ
මතකය අමතක කෙරුමට සිතුවත් දහසක් වාරේ
සදාතනික වේදනාව සදාකල්හි හද පැරේ

♦ *මේජර් වී. බී. කරුණාරත්න*
Oxford UK

*ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන්ට යුද පුහුණුව දිය යුතු යයි මල්වතු විහාරයේ භික්ෂූන් වහන්සේ නමක් හමුදාපතිට යෝජනා කළ බවක් ප්‍රවෘත්ති වල පළවී තිබුණි. මේ කවි පෙළ ඒ පුවත ගැනය.*

## පාසැල් සිසුන්ට යුද පුහුණුව ?

පාසැල් ළමුන්හට ඉන්නට ඉඩ දෙන්න
අදිපන ඇමතිගේ වැඩ බව දැන ගන්න
අප හා උරණ කිසිදාකත් නොම වන්න
හිමියනි දෙපා නමදිමි! දැන් කන් දෙන්න

මෙත් කරුණා දයා ආදිය පුරුදු කොට
දේශන පැවැත් විය යුතුවෙයි ළමුන් හට
අංගුලිමාල දමනය අද මතක් කොට
ඔවදන් දිය යුතුයි දැහැමින් වසන් නට

වර්ජිනියාහි විද්‍යාලෙක සිසු දරුවෙක්
මැරුවා වෙඩිඩි තබා ළමයින් තිස් ගණනක්
මින් අවුරුදු හයක හතකට ඉහත දිනක්
දුටුවෙමු පත් මගින් අපි ඒ වැනි පුවතක්

නවක වදය තවමත් හිස ඔස වන්නේ
ඒවා පණපොවන්ටද මේ සැර සෙන්නේ
පිස්තෝලය එවිට ළමයින් අත වන්නේ
අවිචාරවත් ලෙස මේ අප කොහි යන්නේ

තව රටවලට යොමු කළ මැන ඔබේ නෙත
ඒවා යුදෙන් ගින්නෙන් වැනසිලා ඇත
දහමෙන් තොරවූ රටකින් කිසි වැඩක් නැත
දම්පල් තුමා ගිය මග අරඹමු නැවත

යුද්දය නිමා වුණු අපෙ රට රැක ගන්ට
අපි චන්දය දුන්නෙ අපෙ ජනපති දුන්ට
පාසැල් ළමුන්හට යුද පුහුණුව දෙන්ට
ඔය අදහසට බැහැ! අත්දෙක ඔසවන්ට

♦ *එස්. කංකානම්ගේ*
London SE 5

## පලා යනු මැන

**දුක** යන්න දුරුවී දිගන්තය වෙත
නොඑනු මැන මා වෙත කිසිම දින
නැත ඉඩක් මහද සන්තානයේ
ඔබට කිසිදා යහන් වදිනට

**විශ්ෂෝපය** ඔබද
යනු මැන දුරින් දුරුවී
නැත ඉඩක් මහද සන්තානයේ
නොම හැරෙයි දොර අගුල ඔබ හට
කිසිම දිනයක මහද කුටියේ

**අලසබව** මම ඔබට කියමි
නැත ඉඩක් ඔට මහද කුටියේ
රැඳී දැවටී දිගට ඉන්නට
නොමැත කිසි දා වරම් ඔබහට

**තරහ වෛරය** ඉඩක් නැත මෙහි
අරක්ගන්නට මහද නිවසේ
නැත වරම් නුඹලාට කිසි දා
පලා යන්! හැකි යුහුව හනිකට

♦ *මධුරි අබේවික්‍රම*
Harrow UK

මෙහි පළකිරීම සඳහා ඔබ එවන කාව්‍ය රචනා ඉතා අගේකොට සලකමු. ඒවා අපතේ නොයයි. ඉඩ ලැබෙන අයුරින් ඒවා පළවෙන බව කරුණාවෙන් සලකන්න. - **කර්තෘ**

## EVENING ON A LAWN

I sip a woodapple sherbet
As on the lawn beside a bed of scarlet cannas
I relax on a rattan lounge.
A sprinkler cools the sultry air
A myna and golden oriole frolic in the spray.

Vast kaleidoscopes of constantly changing
cloud patterns colour the sky.
Birds begin their evening's chorusing.
As dusk falls thousands of fruit-bats
zig-zag the sky...
I am summoned by a dinner gong's
mellow resonance.

♦ **Denis Jansz - *London NW8***

## තියුණු අවිය

වෙඩි උණ්ඩයෙන් පස මිතුරන් වැනසෙන් නේ
සා මුව සතුන් දුණු හීයෙන් මියැදෙන් නේ
විකසිත කුසුම් සවසට මුකුලිත වන් නේ
කවියක බලය කිසි කලෙකත් නොබිඳෙන් නේ

හොටබරියෙකුට මීවද රස දැනේ විද
නොබිඳෙන මාළිගා වැල්ලේ තැනේ විද
දිය පිට ඇඳි ඉරක් එලෙසින් රැඳේ විද
රජ අණකටත් කවි පැනක් නැවේ විද

අවියෙන් හැඩ අවිය මළවිගෙ මල් අවිය
සවියෙන් බල සවිය බල දෙවිඳුගෙ සවිය
දිවියෙන් සරු දිවිය දහමට බර දිවිය
කවියෙන් රස කවිය විරිතට ලියූ කවිය

යව්වන සිත්සතන් පුබුදයි හඳ පාන
සිව්පද බල තියේ නව නළු රස ගේන
සැබැවක් වේය සුන්දර දහවල් සීන
බිය නැත කිසිදු රජ අණකට කවි පැන

ඔරු පාරුවෙත් පැළතුළ හා තිරික් කලේ
කමතේ හේනෙ රැඳි පාළුව ඉවත් කළේ
බෝ මළුවේදි දම් සිසිලෙන් සවස් කලේ
දහසක් බොඳුනු සිත් කවියෙනි එකක් කළේ

අහරක් පානයක් දිවගට රස දෙන්නේ
විසිතුරු දසුනකින් දෙනුවන් ඇල ලෙන්නේ
මල්පෙති සුවය දසැඟිල්ලට සුව දෙන්නේ
එකමෙක කවියකින් සියොළඟ පිබි දෙන්නේ

අලිකොටි වග වලස් විකුමන් සිදින් නට
දැඩි නියඟයෙත් රස බෙදමින් ගලන් නට
අණවින කොඩිවිනෙන් බැරි දෙය කරන් නට
බලගතු කවි පැන ඇහැකිද සිඳින් නට?

♦ *ගම්පහ - ෆීලික්ස් ඩී. ප්‍රනාන්දු*
යක්කල Sri Lanka

## ඈතට ගිය මින්බිරියට

ඉපදුණු දා පටන් අප තුරුලෙම හැදුණ
දියණිය මලිති අද දුර ඈතක රැඳුණ
ඔබගේ සුවඳ තවමත් ගේ තුළ බැඳුණ
දිවි සුවඳක් වගෙයි මගෙ නැහැයට වැදුණ

පාසැල ඇරී ඇවිදින් රථයෙන් බිමට
බැසගෙන කුඩය ඈන ඈන බිම එක ලෙසට
සදි අක්කා සමග ආ හැටි යස රහට
තවමත් පෙනෙනවා අද වාගෙම ඇසට

සෙල්ලම් කරපු බඩු තවමත් තැන තැනම
විසිරී තිබෙයි ඔබ ගැන පවසන ලෙසම
බෝනික්කන්ද බලු පැටවුන් සහ සැවොම
ඔබ එන තුරා පසුවෙයි මග බල බලම

එන විට සයිකලෙන් මා ගමනක් ගොසින
දුවගෙන පෙරට විත් සයිකලයට නැගුණ
තව රවුමක් යන්න මට ඇවිටිලි කරන
කී හැටි තවම රැව්දෙයි තුළ මගෙ සවන

අලි ගැන යකුන් ගැන ලස්සන කතන් දර
දුවනිට කියා දුන් හැටි මම නිරන් තර
සිහියට නැගෙන විට හද තුළ වරින් වර
හදවත හඬා වැලපෙනවා දුකින් බර

මම සැප පුටුව මත සවසට වැතිරෙන් නේ
පොඩි දුව ඇවිත් මගෙ උකුළට පැනගන් නේ
කොහොමද එහෙම දැන් අලි ගැන අහගන් නේ
මගෙ දුව මෙහේ නැහැ දුරු රටකනෙ ඉන් නේ

යනවිට ඔබ රැගෙන ගිය සුරතල් බවම
එන විට අරන් එනු මැන එය එක ලෙසම
වෙනසක් දකින්නට අප නොකැමති තරම
වැඩිවී තිබේවා! සිංහලකම බොහොම

හැමදා බුදුන් සවසට පහනින් පුදමී
මලිතිය ඇතුළු සැමදෙන ගැන සිත යොමමී
බැතිබර සිතින් ඔබ සැම සිහිකර වඳිමී
ඔබ රැක දෙන ලෙසින් මම දෙවියන් යදිමී

♦ *හැමිල්ටන් අතපත්තු*
බණ්ඩාරගම Sri Lanka